20 වන පිටෙන්

මේ ගැන කතා වුණා. කොමාන්ඩෝ කණ්ඩායම් මේ වගේ එළිමහන් සටන් වලට යවන්නේ නෑ. කොමාන්ඩෝලගේ ප්‍රධාන අවිය තමයි රහස්‍යභාවය. ඒ ගැන දන්නේ නැතුව ජෙනරාල් ජානක පෙරේරා කියන නිලධාරියා කොමාන්ඩෝ කණ්ඩායම සමඟ එළිමහන් සටනකට බැස්සේ. මේ වෙලාවෙදි ඉතුරු වෙච්ච කණ්ඩායම ගන්න එවෙලේම ගියා ජෙනරාල් ශ්‍රීනාත් රාජපක්ෂ, මේජර් චන්ද්‍රසේන සහ මම. අපි ගිහිල්ලා ඉතුරු වෙච්ච හටයෝ ආරක්ෂා සහිතව ගෙනාවා. එත් තුවාල වෙච්ච අය කොටසක් ඉතිරි වුනා. දැන් ඊළඟට සාකච්ඡා කරනවා එතන ඉන්න තුවාල වෙච්ච අය අරගෙන එන්න. දවස් හතක් තිස්සේ සාකච්ඡා තිබ්බා. ඒ උනාට එතෙන්ට යන්න කවුරුවත් හිටියේ නෑ. ඔක්කොම බයවුණා.ගුවන් හමුදා-වෙනුත් යන්න අකමැති වුණා බය නිසා. ඒ වෙලාවේ හමුදාවේ ජෙනරාල්ලා කිසිම කෙනෙක් කැමති වුනේ නැහැ යන්න. මමත් එතන හිටපු නිසා මම හරියටම දන්නවා. මේ අවස්ථාවේ ගෝඨාභය රාජපක්ෂ සිය කැමැත්තෙන්ම කිව්වා ඒ අය ගේන්න මම යන්නං කියලා. එතුමත් එක්ක ගියා ශවේන්ද්‍ර සිල්වා, කමල් ගුණරත්න, කර්නල් සුමේධ පෙරේරා.මමත් ගියා විශේෂ කණ්ඩායමක් හැටියට. ඒක නිසා ගෝඨාභය රාජපක්ෂ යුද්දෙන් පැනලා ගියා කියන අමන කතා කියන එකට නං මම තදින්ම විරුද්ධයි. ඉතා භයානක අවස්ථාවන් වලදී එතුමා තමයි නිර්භීතව මුහුණ දුන්නේ.

**සන්නස:** ඔබ යහපාලන රජයේ එක්තරා අමාත්‍යවරයකුට රුපියල් ලක්ෂ 50 ක අල්ලසක් දුන්නයි කියලා චෝදනාවක් තියෙනවා මේ ගැන මොකද කියන්නේ.

**සේනාධිපති මහතා:** හොඳයි ඒ ප්‍රශ්නේ ඉදිරිපත් කරපු එකට මම කැමතියි. රාජිත සේනාරත්න ගැන ඔය කියන්නෙ. මිනිහෙ-කුට අල්ලසක් දෙන්න මොකටද? තමන්ට මොනවා හරි වැඩක් කරවගන්න. කර ගෙන යන වැඩේට කරදර කරන්න එපා කියල ඉල්ලන්න.ඔය කිසිම වුවමනාවක් මට නැතිනම් ඇයි මං කාටවත් අල්ලස් දෙන්නෙ? මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කලින් ආණ්ඩුවේ දී මම හිතුවේ රාජිතලා චම්පකල කියන්නේහොඳ වැඩකාරයො කියලා. මම දේශපාලකයින්ට උදව් කරලා තියෙනවා ඒවා ඇත්තටම අල්ලසක් නෙවෙයි. ඒ මිනිස්සුන්ගෙ ඡන්ද වැඩ එහෙම කරගන්න අපි වගේ ව්‍යා-පාරිකයො සල්ලි නුදුන්නොත් මේ මිනිස්සු සල්ලි හොයා ගන්නේ කුඩු මුදලාලිලාගෙන් එහෙම නැත්නම් පාතාලෙන්. මෙන්න මේ තත්වෙන් මේගොල්ලෝ මුදවා ගන්න යම්කිසි ආකාරයක හරි උදව්වක් කරන්නයි මට උවමනා උනේ.මම ඒ ගොල්ලන්ගෙන් ඉල්ලුවේ උඹල අපි දිනාදුන් දේශය හරියට පාලනය කරපල්ලා කියන එක විතරයි. එයා කප්පම් මුදලක් හැටියට මාස්පතා සල්ලි ඉල්ලන කොට මම ඒක දෙන්න සූදානම් වුණේ නෑ. අනෙක මං එයාට එහෙම මුදල් දෙන්න එයා ආරක්ෂක ඇමතිවරයාද, අඩුගානේ යම්කිසි මට්ටමකින් හරි උදව්වක් ගන්න සෞඛ්‍ය ඇමැතිවරයකුට මුදල් දීලා මොකටද මට? අනෙක මම රාජිතගේ මිනිහෙක් එක්ක කරපු දුරකථන සංවාදය එක්තරා රූපවාහිනි වැඩසටහනකින් මම එළිදැක්වූවා. ඒකෙන් ඔය මුදල දීපු එක ගැන ඇත්ත විස්තරය දැනගන්න පුළුවන්.

**සන්නස:** ලංකාවේ ව්‍යාපාරිකයො බොහොම දෙනෙක් දේශපාලකයෝ එක සමීප සබඳතා පවත්වනවා. නමුත් ඔබ ඊට වැඩිය වෙනස්. ලංකාවේ දේශපාලකයෝ ඔබට හතුරුකම් කළේ සේනාධිපති මහතා මං ඔබට කිව්වනේ. මම ව්‍යාපාරිකයෙක් නෙමෙයි. මම සොල්දාදුවෙක්. ඇවන්ගාඩ් කියන ව්‍යාපාරයෙන් සියයට දහයක් තමයි මට තියෙන්නේ. මම මගේ නෝනත් එක්ක පිටරට හරි කොහේ හරි යනකොට වුණත් මේ ගෙවල්වල දොරවල් ඔක්කොම ඇරල යන්නෙ. අපේ රත්තරන් බඩු එහෙම සේරම එළිය තියෙන්නෙ.මෙහෙ ඉන්න අය යන එන අයට අපේ ගෙදර දෙයක් මම සීමා කරලා නෑ. ඔබට පේන්නැති මේ ඉන්න වෙලාවේ වුණත්. මේ ගෙදර ඉන්න අපේ ගාව වැඩ කරන අය සියළුම දෙනා තමන්ගේ අය හැටි මම හිතන්නේ. මං උපයපු ලාභයෙන් මිලියන 700ක් දන් දීලා තියෙනව. වෙන අයෙක් නම් කරන්නේ ඒ වගේ පරිත්‍යාග කරන්න කලින් තමන් ඉස්සෙල්ලා හොඳ ගෙයක් කුරුඳුවත්ත පැත්තෙන් ගන්න එක. මේ ගෙවල් දොරවල් බැලුවම පේනවනෙ මම ජීවත් වෙන්නේ කොහොමද කියලා. සන්නස. මහාචාර්ය සරත් ජයසූරිය ප්‍රසිද්ධියේ කියාගෙන ගියා ඇවන්ගාඩ් කියන්නේ මහා දූෂණයක් සේනාධිපති කියන්නේ වංචාකාරයෙක් කියලා මේ සඳහා ඔබ ප්‍රසිද්ධ විවාදයක් ඔහුගෙන් ඉල්ලුවා.

**සේනාධිපති මහතා:** ඔය මහාචාර්යවරයා ජනතා විමුක්ති පෙරමුණේ කෙනෙක්නෙ. එයා දිගින් දිගටම අපේ ව්‍යාපාරය ගැන කතා කරන කොට මං ඔහුට කතා කරලා කිව්වා ගරු මහාචාර්යතුමා ඔබතුමා කියනවා අපි දූෂකයෝ වංචාකාරයෝ කියලා කරුණාකරලා මේ ගැන තනියෙන් මාධ්‍ය හරහා කියන්නැතුව එන්න මාත් එක්ක ප්‍රසිද්ධ විවාදයකට කියලා. නමුත් ඔහු ආවේ නැහැ. පස්සේ මං ඔහුට දුරකථනයෙන් කිව්වා ගරු මහාචාර්යතුමා මං ඔබතුමා මම ඉතාම ගරු කරන චරිතයක්. ඇයි ඉතින් මට මේ විදියට පහර ගහන්නෙ කියලා. එයා කිව්වා දන්නෙ නැද්ද අපි ඉතිං දේශපාලන චරිතනෙ කියලා. ඊට පස්සේ මං ඇහුවා ඔබතුමා ඉල්ලපු ගාන මම දුන්නෙ නැති නිසාද මේ පහර ගහන්නේ කියලා. හරි හරි අපි ඕව පස්සේ හම්බෙලා කතා කරමු කිව්වා. එයා මේ ඔක්කොම හැදුවේ මගේ මුදල් කඩා ගන්න. දුප්පත් අහිංසක කෙනෙකුට දුන්නත් මම මොකටද මොවුන්ට සල්ලි දෙන්නේ. මේ සියල්ල මම රෙකෝඩ් කරල තියෙන්නෙ. කමාන්ඩෝ රෙජිමේන්තුව ප්‍රතිත්‍රස්ත ඒක ඒකකයේදී අපි ඉගෙන ගෙන තියෙනවා ත්‍රස්තවාදීන් එක්ක ප්‍රමන්ත්‍රණය ( nego-tiate) කරන්න.ඒ කියන්නේ අපි සූදානම් වෙනකන් අපට අවශ්‍ය කාලය ලබා ගන්න. negociation මම හොඳට පුරුදු වෙලා තියෙන්නේ.

**සන්නස:** නයිජීරියා රජය සමඟ මුහුදු ආරක්ෂක ගිවිසුමක් අත්සන් කිරීමට ගියා. එය කලා නම් ඩොලර් බිලියන දෙකක් වසරකට අපේ රටට ලබාගන්න තිබුණා. ඒ විතරක් නෙවෙයි 25,000කට රැකියාව දෙන්න පුළුවන්කමක් තිබුණා. ඔබ කියනවා එම ගිවිසුම අත්සන් කරන්න ඉඩ ඇරියා නං මිබන්තොට වරාය විකුණන්න අවශ්‍ය වෙන්නේ නෑ කියලා. ඔබට විදේශ ගමන් තහනමක් පනවපු නිසා එය අත්සන් කරන්නට යන්න බැරිවුනා. නයිජීරියානු රජය සමඟ අපිට ඒ අවස්ථාව අහිමි උනාද?

**සේනාධිපති මහතා:**. නෑ ,ඇත්තටම මට ඒකට යන්න අවස්තාව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ලබා දුන්නා. ආරක්ෂක අමාත්‍යාංශයෙන් අපිට ලියුමක් ලබා දුන්න නයිජීරියානු රජය සමඟ මෙම ගිවිසුම අත්සන් කිරීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිශ්ශංක සේනාධිපති මහතාට මින් බලය පවරමි. මේ මගින් ශ්‍රීලංකා රජය අපේක්ෂා කරන්නේ රැකියා 25000 ක් හා ඇමරිකානු ඩොලර් බිලියනයක් උපයාගැනීමයි. මෙම සියලුම ලිපි ලේඛන පරීක්ෂාකර සුපරීක්ෂා කර විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව මේ තීරණයට ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අමාත්‍ය එළඹෙන ලදී කියල ලියල අත්සන් කරලා දුන්න. ඊට පස්සේ ගිවිසුම අත්සන් කළා. ඊට පස්සේ ආපහු පා.ච. රණවකයි රාජිතයි මැදිහත් වෙලා ඒක නතර කරල දැම්මේ. එක අපේ රටට කරපු විශාල අපරාධයක්. 2019 දී මෛත්‍රීපාල මහත්තයා ඇවන්ගාර්ඩ් ආයතනය යලි ස්ථාපනය කිරීමට කටයුතු කළා.ප්‍රතිස්ථාපනය කරනවද නිත්‍යානුකූල නැතිනම්? අනෙක නයිජීරියාවත් එක්ක ඔය වගේ ගිවිසුමක් අත්සන් කරන්න කාටද?

**සන්නස:** වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයා රට ගොඩ නැගීමේ අවංක උවමනාවකින් කටයුතු කරනවා.එතුමා ඔබේ තිබෙන දක්ෂතා වලින් ප්‍රයෝජන ගනීවිද?

**සේනාධිපති මහතා:** එතුමා කියනවා මෙම ඇවන්ගාර්ඩ් කියන සංකල්පය මීට පෙර තිබුනේ නැහැ.මෙය අලුත්ම සංකල්පයක්.මෙය නාවික හමුදාව සහ පෞද්ගලික ආයතනයක් එකතුවී ලංකාවට විශාල විදේශ විනිමයක් ගෙනදුන් සංකල්පයක් විතරක් නෙමෙයි විශාල රැකියා ප්‍රමාණයක් ලබා දෙන්නටත් සමත් වුන එකක්. මෙහෙම සංකල්පයක් මේ රටේ මීට කලින් තිබුනෙ නෑ. ඒක බොරු නඩු දාලා මිපූර්ණයෙන්ම විනාශ කරා කියලා එතුමා ප්‍රකාශ කර සිටියා.

අවනඩුවක් දාලා මාව හිරේට යැව්වා. නමුත් සිරගත වෙලා හිටපු කාලය තුළත් මට නම් අලුත් අදහස් ආවා. ඇත්තටම මට ඇප පිට නිදහස් වන්නට හොඳටම ඉඩකඩ තිබුණා. එක් අවස්ථාවක නඩුකාර හාමුදුරුවෝ මගේ මූණ දිහා බැලුවා ඇයි මෙයා ඇප ඉල්ලන්නේ නැත්තෙ කියලා. මං මගේ නීතිඥයන්ට කිව්වා ඇප ඉල්ලන්න එපා කියලා. මොකද හිරගෙදර ගත කරපු කාලය තුළ සිරගත කර ඇති මනුෂ්‍යයන් පිළිබඳ මම බොහෝ දේවල් ඉගෙන ගත්තා. මේ සිරකරුවන්ගෙන් වැඩි දෙනෙක් මෙතෙන්ට ඇවිල්ල තියෙන්නේ ඒගොල්ලන්ගෙ වරදවල් නිසා නොවෙයි සමාජයේ වරද නිසා. මේ බොහොමයක් අයට නිසියාකාරව ඉගෙන ගැනීමට ගෞරවාන්විත රැකියාවක් කිරීමට මේ සමාජයේ මගින් ඉඩ පහසුකම් සලසලා තිබුණා නං ඔවුන් මෙසේ සිරගත වන්නේ නෑ. දැනට වෙලා තියෙන්නේ මොවුන්ගේ සිරගත කරන ලද කාලය නිමා වූ පසුව නැවත සමාජයට ගොස් ඔවුන්ට කරන්න රැකියාවක් නෑ. මේ හේතුව නිසා මත ද්‍රව්‍ය වෙළඳන් කරපු අය නැවතත් වෙළඳාම පාතාලයේ කටයුතු කරපු අය නැවතත් එම කටයුතු වලටම ආදී සමාජ විරෝධී කටයුතු කරලා නැවත ටික කාලෙකදි සිරගත වෙනවා. මම කල්පනා කළා මට පුලුවන්ද මේ තත්ත්වය යම්කිසි මට්ටමකින් හරි වෙනස් කරන්න කියලා. මම දැන් වර්තමාන රජය හා ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කරලා මොවුන්ට යම්කිසි වෘත්තීය පුහුණුවක් ලබාදෙන ක්‍රමවේදයක් සකස් කළා මේ සඳහා මට බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඉහළම සහයෝගය ලැබෙනවා මෙහි මූලික පියවර හැටියට සිරකරුවන් 5000 කට මම පෙදරේරු වෘත්තිය වඩු වැඩ විදුලි කාර්මික ශිල්පය ජලනල එලීම පිළිබඳව ආදී පාඨමාලාවන් රැසක් මගින් මොවුන් සුදුසු බවට පත් කරනවා පාඨමාලාව අවසානයේ මොවුන්ට ප්‍රායෝගිකව පුහුණුවක් ලබාදීලා මට පුළුවන් විදේශගත කරවන්න. පහසුවෙන් මේ අයට ඩොලර් පන්දාහක් පමණ වැටුප් ලබන රැකියාවල් මට සොයා දෙන්න පුළුවන්. මෙහි දෙවැනි අදියර ක්‍රියාත්මක කිරීමෙන් පසු මේ සිරකඳවුරුවල තියෙන තදබදය සහමුලින්ම නැතුව යයි කියලා මා විශ්වාස කරනවා මොකද සිරගෙවල් පිරෙන්නේ එකම සිරකරුවා නැවත නැවත වතාවක් සිරගෙදරට පැමිණීම නිසයි. මේ පුරවැසියන් යහපත් පුරවැසියන් බවට පත් කරලා රටට වැඩදායී මිනිසුන් බවට ගෙන ඒම ට ලැබීම මම මගේ ජීවිතේ ලද විශාල භාග්‍යයක් ලෙස මා සලකනවා.

**සන්නස:** අවසාන වශයෙන් ඔබ ඒ නම තියෙන සේනාධිපති කියන කොටස ඔබේ නම ද එසේ නොවේ නම් පෙලපත් නාමය ද?

**සේනාධිපති මහතා:** මගේ පෙළපත් නාමය යාපා. නිශ්ශංක සේනාධිපති කියන්නේ නම.

**සන්නස:** ඒ කියන්නේ ඔබ සේනාධිපතියෙක් වෙන බව කුඩා කාලෙදිම දෙමාපියන් දැනගෙන ඉඳලා තියෙනවා.

**සේනාධිපති මහතා:** මගේ කේන්දරය බලල තමයි ඔය සේනාධිපති කියන කොටස එකතු කරලා තියෙන්නේ. සමහරවිට දෛවඥය කියන්න මම හමුදාවක නිලධාරියෙක් වන බව.

**සන්නස:** ඉතාමත්ම කාර්යබහුල වෙලාවක සන්නස වෙනුවෙන් ඔබගේ වටිනා කාලය වෙන්කර දීම සම්බන්ධව අප ඔබට බෙහෙවින් ස්තූති වන්ත වන අතර ඔබ මේ කරන්නා වූ යහපත් කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා කියා සුභ පාර්ථනා කරනවා ආයුබෝවන්!

**සේනාධිපති මහතා**
ආයුබෝවන් !

සාකච්ඡා කළේ
**චිත්‍රාන් මොරකන්දෙ ගමගේ**

